මගේ අංකය: 3/5/පත්කිරීම්/2021
මානව සම්පත් කළමනාකරණ අංශය
රාජ්‍ය දැව සංස්ථාව
2021.01.15

සාමාන්‍යාධිකාරි
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්
සහකාර සාමාන්‍යාධිකාරිවරුන්
ප්‍රාදේශිය කළමනාකරුවන්
කළමනාකරුවන්/ නියෝජ්‍ය කළමනාකරුවන්
ඒකක ප්‍රධානීන්
සංස්ථාවේ සියළුම සේවකයින් වෙත.

# **පුරප්පාඩු**

පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරිම සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති ශ්‍රි ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් 2021.01.30 දින හෝ ඊට පෙර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පාලන) වෙත ලැබෙන සේ එවිය යුතුය. තැපැලේදි අස්ථාන ගතවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් තම අයදුම්පත් මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කර අංශ ප්‍රධානියා /ප්‍රාදේශිය කළමනාකරු/ඒකක ප්‍රධානි මගින් ඉදිරිපත් කළ යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන ආදර්ශ අයදුම්පත් www.timco.lk යන වෙබ් අඩවියෙන් භාගත කල හැක). අසම්පූර්ණ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අනියම් හෝ වෙනත් පදනමක් මත සේවයේ නියුතු පුද්ගලයන්ට බාහිර සුදුසුකම් යටතේ අයදුම් කල හැකිය.

## 1. “ජ්‍යෙෂ්ඨ කළමනාකාර” සේවා ශ්‍රේණිය (HM)

### 1.1. තනතුර : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ඉංජිනේරු හා නිෂ්පාදන) (HM 1-2)

**වැටුප් පරිමාණය: රු. 81,670 - 15×2,270 – 115,720**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II )**

**I.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංජිනේරු/ව්‍යාපාර පරිපාලනය/කළමනාකරණ /විද්‍යා/ කෘෂිකර්මය හෝ ක්ෂේත්‍රයට අදාල වෙනත් උපාධියක්

**සමඟ**

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම

II. තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II )**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

II. ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1) සේවා ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර දෙකක (02)ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**1.2. තනතුර: සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) (HM 1-1)**

**වැටුප් පරිමාණය : රු. 81,295 - 15×2,270 – 114,345**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවි/ව්‍යාපාර පරිපාලන/ ව්‍යාපාර කළමනාකරණ / කළමනාකරණය හෝ ක්ෂේත්‍රයට අදාල වෙනත් උපාධියක්

**සමග**

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) ලබා තිබීම

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර දහතුනක (13) පළපුරුද්දක් ලබා තිබීම

II. තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර දහතුනක (13) පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. කළමනාකාර (MM 1-1) සේවා ගණයෙහි I ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 1.3. බඳවා ගන්නා ආකාරය

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරික්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්‍ෂණයේ දක්වන කුසලතා අනු පිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

## 1.4. ඉහත තනතුරු සඳහා සම්මුඛ පරික්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාල අතිරේක අධ්‍යාපන/වෘත්තිය සුදුසුකම් | - ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | - ලකුණු 15 |
| සම්මුඛ පරික්ෂණයේදී කාර්යය සාධනය | - ලකුණු 25 |
| | උපරිම ලකුණු 100 |

**1.5.** වයස : වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

## 1.6. ස්ථිර කිරිම

බාහිර අයදුම්කරුවන් අතරින් පත්කරනු ලබන නිලධාරියෙකු වසර තුනක(03) ක පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරිම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේදි සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරක වැඩ බැලිමේ කාලසීමාවකට යටත් කෙරේ.

## 2. “කළමනාකාර” සේවා ගණය (MM කාණ්ඩය)

**වැටුප් පරිමාණය : රු. 53,175 – 10×1,375 – 15×1,910 – 95,575**

**2.1. තනතුර : කළමනාකාර (මුදල්)**

**සුදුසුකම්**

**අභ්‍යන්තර අයදුම්කරුවන් පමණි**

කළමනාකාර” සේවා ගණයේ (MM 1-1) II ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර (10) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**2.2. තනතුර: නියෝජ්‍ය කළමනාකාර (මුදල්) (MM 1-1)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II )**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය/ගිණුම්කරණය/වාණිජ්‍යය හෝ අදාළ ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක්

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පලපුරුද්දක් ලබා තිබීම

II. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ICASL) අතරමැදි මට්ටමේ සුදුසුකම / වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ (CIMA) අතරමැදි මට්ටමේ සුදුසුකම / ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ (CMA) අතරමැදි මට්ටමේ සුදුසුකම / වරලත් සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) අතරමැදි මට්ටමේ සුදුසුකම් / උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) ලබා තිබීම

**සහ**

අදාල සුදුසුකම ලබාගත් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පලපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

II. කණිෂ්ඨ කළමනාකරණ (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**2.3. තනතුර : කළමනාකාර /නියෝජ්‍ය කළමනාකාර (පර්යේෂණ හා පුහුණු) (MM 1-1)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව/භෞතික විද්‍යාව/ කෘෂිකර්මය /ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

සහ

උපාධිය ලබාගැනිමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පලපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. කණිෂ්ඨ කළමනාකරණ (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**2.4. තනතුර: කළමනාකාර /නියෝජ්‍ය කළමනාකාර (දැව ශ්‍රේණිකිරීම් හා වෙන්දේසි)**

**2.5. තනතුර: කළමනාකාර/ නියෝජ්‍ය කළමනාකාර (දැව පදම්කිරීම් හා පරිරක්ෂණ) (MM 1-1)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව/භෞතික විද්‍යාව/ කෘෂිකර්මය /කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

සහ

උපාධිය ලබාගැනිමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පලපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. කණිෂ්ඨ කළමනාකරණ (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**2.6. තනතුර: කළමනාකාර/ නියෝජ්‍ය කළමනාකාර (ගෘහභාණ්ඩ සංකීර්ණ) (MM 1-1)**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන්**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නිෂ්පාදන හා මෙහෙයුම් කළමනාකරණය / ගෘහභාණ්ඩ නිර්මාණය / විද්‍යාව / භෞතික විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

සහ

උපාධිය ලබාගැනිමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පලපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. කණිෂ්ය කළමනාකරණ (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**2.7. තනතුර: කළමනාකාර/ නියෝජ්‍ය කළමනාකාර (සිවිල් ඉංජිනේරු) (MM 1-1)**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II )**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු පිළිබඳ උපාධියක්

සහ

උපාධිය ලබාගැනිමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පලපුරුද්දක් ලබා තිබීම

II. ක්ෂේත්‍රයට අදාළව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හත (07) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

අදාල සුදුසුකම ලබාගත් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පලපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. කණිෂ්ය කළමනාකරණ (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**2.8. බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරික්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්‍ෂණයේ දක්වන කුසලතා අනු පිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

**2.9. ඉහත තනතුරු සඳහා සම්මුඛ පරික්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාල අතිරේක සුදුසුකම් | - ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | - ලකුණු 15 |
| සම්මුඛ පරික්ෂණයේදී කාර්යය සාධනය | - ලකුණු 25 |
| | උපරිම ලකුණු 100 |

**2.10.** වයස : වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි

**2.11. ස්ථිර කිරීම**

බාහිර අයදුම්කරුවන් අතරින් පත්කරනු ලබන නිලධාරියෙකු වසර තුනක(03) ක පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේදි සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරක වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කෙරේ.

## 3. "කණිෂ්ඨ කළමනාකාර "සේවා ගණය (JM කාණ්ඩය) – II ශ්‍රේණිය

**3.1.** වැටුප් පරිමාණය: රු. 42,600 - 755×10 - 1,135×18 – 70,580

**3.2.** තනතුර: **සහකාර කළමනාකාර (මුදල්)** **(JM 1-1)**

**3.3.** තනතුර: **සහකාර අභ්‍යන්තර විගණක** **(JM 1-1)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II )**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය/ගිණුම්කරණය/වාණිජ්‍යය හෝ උපාධියක්

II. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ICASL) අන්තර්මධ්‍ය සුදුසුකම / වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ (CIMA) අන්තර්මධ්‍ය සුදුසුකම / ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ (CMA) අන්තර්මධ්‍ය සුදුසුකම / වරලත් සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) අන්තර්මධ්‍ය සුදුසුකම / උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන (**MA1**) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.4. තනතුර: සහකාර කළමනාකාර (පාලන) (JM 1-1)**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන්**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/රාජ්‍ය කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

II. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
III. කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන (**MA1**) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.5. තනතුර: සහකාර කළමනාකාර (මානව සම්පත්) (JM 1-1)**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන්**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/රාජ්‍ය කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන (**MA1**) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.6. තනතුර: සහකාර කළමනාකාර (අලෙවි) (JM 1-1)**

__සුදුසුකම්__

**බාහිර අයදුම්කරුවන්**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවි/පාරිභෝගික සබඳතා කළමනාකරණ (Customer Relationship Management)/ සැපයුම් දාම කළමනාකරණය (Supply Chain Management) / සැපයුම් කළමනාකරණය (Logistic Management) පිළිබඳ උපාධියක්

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

II. කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන (**MA1**) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.7. තනතුර: සහකාර කළමනාකාර (ප්‍රදර්ශනාගාර) (JM 1-1)**

__සුදුසුකම්__

**බාහිර අයදුම්කරුවන්**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවි/ව්‍යාපාර කළමනාකරණය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

II. කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන (**MA1**) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.8. තනතුර: ඉංජිනේරු සහකාර (සිවිල්) (JM 1-1)**

__සුදුසුකම්__

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II හෝ III )**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු පිළිබඳ උපාධියක්

II. ඉංජිනේරු පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා- (සිවිල්) සුදුසුකම සහ අදාළ සුදුසුකම ලබා ගැනිමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර 05 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම

III. ඉංජිනේරු (සිවිල්) පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා (NDT in Civil Engineering ) සුදුසුකම / ඉංජිනේරු විද්‍යාව (සිවිල්) ජාතික ඩිප්ලෝමාව (NDES – Civil Engineering ) සුදුසුකම සහ අදාළ සුදුසුකම ලබා ගැනිමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර 05 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

II. කළමනාකරණ සහකාර- තාක්ෂණික (MA2) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.9. තනතුර: ඉංජිනේරු සහකාර (විදුලි) (JM 1-1)**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II හෝ III )**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදුලි ඉංජිනේරු පිළිබඳ උපාධියක්

II. ඉංජිනේරු පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා- (විදුලි) සුදුසුකම සහ අදාළ සුදුසුකම ලබා ගැනිමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර 05 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම

III. ඉංජිනේරු (විදුලි) පිළිබඳ ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා (NDT in Electrical Engineering ) සුදුසුකම / ඉංජිනේරු විද්‍යාව (විදුලි) ජාතික ඩිප්ලෝමාව (NDES – Electrical Engineering ) සුදුසුකම සහ අදාළ සුදුසුකම ලබා ගැනිමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර 05 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

II. කළමනාකරණ සහකාර- තාක්ෂණික (MA2) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.10. තනතුර: සහකාර කළමනාකාර (පර්යේෂණ හා සංවර්ධන) (JM 1-1)**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන්**

**I.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව /භෞතික විද්‍යාව/කෘෂිකර්මය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක්

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන (MA1) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.11. තනතුර: සහකාර කළමනාකාර (පද්ධති පරිපාලන) (JM 1-1)**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II හෝ III හෝ IV)**

**I.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණය/තොරතුරු පද්ධති/තොරතුරු කළමනාකරණය/පරිගණක ජාල/පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක්

**II.** ක්ෂේත්‍රයට අදාළව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හත (07) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**III.** ක්ෂේත්‍රයට අදාළව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හය (06) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අදාළ සුදුසුකම ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර 05 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම.

**IV.** ක්ෂේත්‍රයට අදාළව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

අදාළ සුදුසුකම ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර 10 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. කළමනාකරණ සහකාර- තාක්ෂණික නොවන (MA1) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.12. තනතුර: ඉරුම්හල් උපදේශක (JM 1-1)**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන් (පහත I හෝ II හෝ III හෝ IV)**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව /භෞතික විද්‍යාව /ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක්

II. ක්ෂේත්‍රයට අදාළව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හත (07) වැනි මට්ටමට නොඅඩු මට්ටමට ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

III. ක්ෂේත්‍රයට අදාළව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) හය (06) වැනි මට්ටමට නොඅඩු මට්ටමට ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

අදාළ සුදුසුකම ලබා ගැනිමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර 05 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම.

IV. ක්ෂේත්‍රයට අදාළව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමට ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

අදාළ සුදුසුකම ලබා ගැනිමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් වසර 10 ක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත I හෝ II)**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
II. කළමනාකරණ සහකාර- තාක්ෂණික (MA2) සේවා ගණයෙහි II ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.13. බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරික්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්‍ෂණයේ දක්වන කුසලතා අනු පිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

**3.14. ඉහත තනතුරු සඳහා සම්මුඛ පරික්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාල අතිරේක සුදුසුකම් | - ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | - ලකුණු 15 |
| සම්මුඛ පරික්ෂණයේදී කාර්යය සාධනය | - ලකුණු 25 |
| | උපරිම ලකුණු 100 |

**3.15.** වයස : වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි

# 4. "කළමනාකරණ සහකාර (තාක්ෂණික) " සේවා ගණය - III ශ්‍රේණිය

වැටුප් පරිමාණය: රු. 30,310 - 300×10 - 350×7 - 600×4 - 710×20 – 52,360

| | | | |
|---|---|---|---|
| **4.1.** | තනතුර: | **ඉරුම්හල් අධීක්ෂක** | **(MA 2-2)** |
| **4.2.** | තනතුර: | **නිෂ්පාදනාගාර සහකාර** | **(MA 2-2)** |
| **4.3.** | තනතුර: | **කම්දෙටු (ඉරුම්හල්)** | **(MA 2-2)** |

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

I. ක්ෂේත්‍රයට අදාලව තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා(NVQ) පහ(05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා ගැනීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

I. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම අදාල වේ.

**4.4. බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරික්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්‍ෂණයේ දක්වන කුසලතා අනු පිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

**4.5. ඉහත තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාල අතිරේක අධ්‍යාපන සුදුසුකම් | - ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | - ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී කාර්යය සාධනය | - ලකුණු 25 |
| | උපරිම ලකුණු 100 |

**4.6.** වයස : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**4.7. ස්ථිර කිරීම**

බාහිර අයදුම්කරුවන් අතරින් පත්කරනු ලබන නිලධාරියෙකු වසර තුනක(03) ක පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරක වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කෙරේ.

## 5. "කළමනාකරණ සහකාර" (තාක්ෂණික නොවන) සේවා ගණය - III ශ්‍රේණිය

වැටුප් පරිමාණය: රු. 27,910 - 300×10 - 7×350 - 12×600 - 20×710 – 49,080

**5.1. තනතුර: සැලසුම්කරු (MA 1-2)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

I. සිංහල/දෙමළ සහ ගණිතය යන විෂයයන් ඇතුලත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම

II. අ.පො.ස. (උ.පෙළ) විභාගය විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 03 කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම

III. පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයක් විසින් පවත්වනු ලබන සැලසුම්කරණය (Draftsmanship) පිළිබඳව ඩිප්ලෝමා හෝ සහතිකපත්‍ර පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය) , ප්‍රාථමික මට්ටමේ (අර්ධ ශිල්පීය) හා ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) යන කාණ්ඩවල සේවකයින් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

**I. අධ්‍යාපන සුදුසුකම්**

අ.) සිංහල/දෙමළ සහ ගණිතය යන විෂයයන් ඇතුලත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම

අ.) පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයක් විසින් පවත්වනු ලබන සැලසුම්කරණය (Draftsmanship) පිළිබඳව ඩිප්ලෝමා හෝ සහතිකපත්‍ර පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**II. වෙනත් සුදුසුකම්**

ඉහත සේවා කාණ්ඩ යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් අවුරුදු පහක් (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම.

**5.2. තනතුර: ගබඩා නිලධාරි (MA 1-2)**

**<u>සුදුසුකම්</u>**

**බාහිර අයදුම්කරුවන්**

I. සිංහල/දෙමළ සහ ගණිතය යන විෂයයන් ඇතුලත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.

II. අ.පො.ස. (උ.පෙළ) විභාගය විද්‍යා හෝ වාණිජ්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 03 කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය) , ප්‍රාථමික මට්ටමේ (අර්ධ ශිල්පීය) හා ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) යන කාණ්ඩවල සේවකයින්ට අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

**I. අධ්‍යාපන සුදුසුකම්**

සිංහල/දෙමළ සහ ගණිතය යන විෂයයන් ඇතුලත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.

**III. වෙනත් සුදුසුකම්**

ඉහත සේවා කාණ්ඩ යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් අවුරුදු පහක් (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම.

**5.3. තනතුර: වැඩබිම් නිලධාරි (MA 1-2)**

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

I. සිංහල/දෙමළ සහ ගණිතය යන විෂයයන් ඇතුලත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.

II. අ.පො.ස. (උ.පෙළ) විභාගය විද්‍යා, වාණිජ්‍ය හෝ කලා විෂය ධාරාවෙන් විෂයයන් 03 කින් (සාමාන්‍ය පොදු පරික්ෂණය හැර) සමත්වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

පහත සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය), ප්‍රාථමික මට්ටමේ (අර්ධ ශිල්පීය) හා ප්‍රාථමික මට්ටමේ (ශිල්පීය නොවන) යන කාණ්ඩවල සේවකයින්ට අයදුම් කිරිමට සුදුසුකම් ලබයි.

I. **අධ්‍යාපන සුදුසුකම්**

සිංහල/දෙමළ සහ ගණිතය යන විෂයයන් ඇතුලත්ව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම.

II. **වෙනත් සුදුසුකම්**

ඉහත සේවා කාණ්ඩ යටතේ ස්ථිර තනතුරක අවම වශයෙන් අවුරුදු පහක් (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම.

**5.4. බඳවා ගන්නා ආකාරය**

සුදුසුකම් ලත් අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරික්ෂණයකට භාජනය කොට සම්මුඛ පරීක්‍ෂණයේ දක්වන කුසලතා අනු පිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

**5.5. ඉහත තනතුරු සඳහා සම්මුඛ පරික්ෂණයේ ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | |
|---|---|
| අදාල අතිරේක පළපුරුද්ද | - ලකුණු 30 |
| අදාල අතිරේක අධ්‍යාපන සුදුසුකම් | - ලකුණු 30 |
| අනෙකුත් කාර්ය සාධනයන් හා කුසලතා | - ලකුණු 15 |
| සම්මුඛ පරික්ෂණයේදී කාර්යය සාධනය | - ලකුණු 25 |
| | උපරිම ලකුණු 100 |

**5.6.** වයස : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

### 5.7. ස්ථිර කිරීම

බාහිර අයදුම්කරුවන් අතරින් පත්කරනු ලබන නිලධාරියෙකු වසර තුනක(03) ක පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේදි සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් එක් වසරක වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කෙරේ.

## 6. සුදුසුකම් ලබන දිනය

අයදුම්පත් කැඳවන අවසාන දින වන විට ඉහත දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

## 7. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට දායක කරනු ලැබේ. උසස් කරනු ලබන සංස්ථා සේවකයින්ට බලපාන පොදු කොන්දේසි අදාල වේ.

<u>සටහන !</u> (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා)

අදාල අංශ ප්‍රධානීන්ගෙන් හෝ ප්‍රාදේශිය කළමනාකරුවන් මඟින් ඉල්ලුම් පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් පිළිබඳව සේවා ඇගයීම් වාර්තාවක් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.

- **ඉහත සතුටුදායක කාලය යනු උසස්වීම සඳහා අයදුම්කරන දිනට පූර්වාසන්න වසර 05 ක සේවා කාලය තුල යෙදුනු සියළුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූ ද ඒ කාලය තුල කල වරදකට (අවවාද කිරීමක් හෝ තදින් අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා නැත්තා වූද සේවා කාලයකි.**

**සභාපති,**
**<u>රාජ්‍ය දැව සංස්ථාව.</u>**